නෙත් FM

# 5 පහේ පන්තිය

**01** හාල් 1 kgක මිල රු. 75.00කි. එසේ නම් හාල් $4\frac{1}{2}$ kg ක මිල කීය ද?

රුපියල් ..............................................................................................

**02** දොඩම් ගෙඩියක මිල රුපියල් 40.00කි. අන්නාසි ගෙඩියක මිල රුපියල් 120.00කි. ඇපල් ගෙඩියක මිල රුපියල් 30.00කි. අමර මේ සියලු පලතුරුවලින් එක බැගින් මිලට ගත් අතර චාමර අන්නාසි හැර මෙම සියලු පලතුරුවලින් දෙක බැගින් මිලට ගත්තේ ය. ඔවුන් දෙදෙනාගේ බිල්පත් අතර වෙනස කොපමණ ද?

රුපියල් ..............................................................................................

**03** එක්තරා වැඩක් නිම කිරීමට කම්කරුවන් දෙදෙනෙකුට දින 6ක් ද, කම්කරුවන් 3 දෙනෙකුට දින 4ක් ද ගත වේ. කම්කරුවන් 6 දෙනෙක් යෙදූ විට එම වැඩය දින කීයකින් නිමා කළ හැකි ද?

..............................................................................................

★ **එක්තරා කම්හලක නිපද වූ ටයර් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ. ඒ ඇසුරෙන් අංක 18 සහ 19 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| සතිය | ටයර් ප්‍රමාණය |
|---|---|
| 1 | 1000 |
| 2 | 1850 |
| 3 | 1254 |
| 4 | 1480 |

**04** කම්හලේ නිපද වූ මුළු ටයර් ප්‍රමාණයෙන් $\frac{1}{4}$ක් අලෙවි වූයේ නම් අලෙවි වූ ටයර් ප්‍රමාණය කොපමණ ද?

..............................................................................................

**05** නිපද වූ ටයර් ප්‍රමාණ අතර 370ක වෙනසක් ඇත්තේ කුමන සති දෙකේ ද?

..............................................................................................

**06** පහත සංඛ්‍යා කාඩ්පත් ඇසුරින් පිළිතුරු සපයන්න.

| 4 | 0 | 6 | 1 |
|---|---|---|---|

මෙම කාඩ්පත් අතරින් සෑදිය හැකි විශාල ම සංඛ්‍යාවත් කුඩා ම සංඛ්‍යාවත් අතර වෙනස කීය ද?

..............................................................................................

PAPERMASTER.LK

07 අඹ ගොඩක ගෙඩි 450ක් තිබුණි. එයින් ගෙඩි 30ක් නරක් වූ නිසා ඉවත දමන ලදී. ඉතුරු ගෙඩි සියල්ල සමාන ව පෙට්ටි 6ක අසුරන ලදී. එක පෙට්ටියක අඹ ගෙඩි කීයක් තිබේ ද?

..........................................................................................

08 

මෙම රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් කොපමණ කොටසක් ද?

..........................................................................................

09 පහත සැකසුම දෙස බලා හිස්තැනට සුදුසු ගණිත කර්ම යොදන්න.

6 ......... 8 ......... 36 = 84

10 6 හා 9 අතර ඇති සංඛ්‍යා දෙක රෝම ඉලක්කම් යොදාගෙන අනුපිළිවෙළින් ලියා දක්වන්න.

..........................................................................................

11 ප.ව. 6.40ට පිටත් වූ බස්රියක් ඊට පසු දා පෙ.ව. 1.30ට ගමන අවසන් කළේ ය. ගමන අතරතුර ආහාර ගැනීම හා තේ පානය සඳහා පැය 1 මිනිත්තු 30ක් බස්රිය නතර කළේ නම් බස් රථය ධාවනය වූ කාලය කොපමණ ද?

පැය ........................... මිනිත්තු ...........................

12 රු.100.00 නෝට්ටු දෙකකින් හා රු.50.00 නෝට්ටුවකින් රු.217.50ක මුදලක් ගෙවූ විට ලැබෙන ඉතුරු මුදල කොපමණ ද?

රුපියල් ..............................................................

12 පහත රූපය ඇසුරින් පිළිතුරු සපයන්න.



i. මෙම රූපයේ කුඩා කොටුවක එක් පැත්තක දිග 1 cm වේ. මෙම රූපයේ වටේ දිග කොපමණ ද?

.................................................................. cm

ii. මෙම කුඩා කොටු එකතු කර සමචතුරස්‍රයක් නිර්මාණය කරන්නේ නම් ඉවත් කළ යුතු කොටු ගණන කීය ද? ..................................................

14 පාසලක ප්‍රධාන ජල ටැංකියට ජලය ලීටර 1500ක් පිරවිය හැකි ය. කුඩා ජල ටැංකියට ජලය ලීටර 500ක් පිරවිය හැකි ය. එක් දිනක තුන් වතාවක් මෙම ටැංකි සම්පූර්ණයෙන් පිරවීමට සිදුවිය. එදින පස්වරු 4.30 වන විට මෙම ටැංකිවල ඉතුරු ව තිබුණේ ජලය ලීටර 250ක් පමණි. එදින භාවිත වූ ජල ප්‍රමාණය කොපමණ ද?

ලීටර ..............................................................

15 


මෙහි A හා B නගර D සිට සමාන දුරින් පිහිටියේ ය. DC අතර දුර, BD අතර දුර මෙන් දෙගුණයකි. DC අතර දුර 2 km 250 m නම් A සිට D හරහා B වෙත දුර කොපමණ ද?

...................... km ......................... m

PAPERMASTER.LK